# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1969/17 - 2016 ජූනි මස 01 වැනි බදාදා - 2016.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන නිවේදනයයි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (422 අධිකාරය) 10 (සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රෙගුලාසියකි.

ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන්,
සභාපති,
මුදල් මණ්ඩලය - ශ්‍රී ලංකා මහ බැංකුව.

2016 ක් වූ මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

**මුදල් තැරැව්කරණ රෙගුලාසි**

2013 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි සඳහා සංශෝධනය

1.1 මෙම රෙගුලාසි ''2016 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි'' යනුවෙන් හැඳින්විය යුතු ය. — 1. උධෘතය

2.1 2013 පෙබරවාරි 08 වැනි දින අංක 1796/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි පහත දැක්වෙන පරිදි සංශෝධනය වේ. — 2. ප්‍රධාන රෙගුලාසිය සඳහා සංශෝධන

(1) රෙගුලාසිය 20 අවලංගු කර ඒ සඳහා මතු සඳහන් නව රෙගුලාසිය ආදේශ කිරීම.

20.1 බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින්, ගණුදෙනුකාර පාර්ශ්ව විසින් සපයනු ලබන එක් එක් මිළ ප්‍රකාශන/ලංසු තැබීම් සහ මුදල් තැරැව්කරණ සමාගම් හරහා සිදුවන අතරමැදි ගණුදෙනු පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් තැරැව්කරණ සමාගම් වෙත සපයනු ලබන මංගත අතුරුමුහුණතට (on-line interface) එම ගණුදෙනු වලින් පසු විනාඩි 30 ක් නොඉක්මවන කාලයකදී උඩුගත (upload) කළ යුතු ය.

20.2 මෙහි සඳහන් කාලය ඇතුළත සඳහන් කරන ලද තොරතුරු සැපයීම පිළිබඳව මුදල් තැරැව්කරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ/හෝ ගණුදෙනු කුටියේ (dealing room) බලධාරියා වග කිව යුතු ය.

20.3 මංගත ලංසු තැබීම් පද්ධතිය (on-line bidding system) අක්‍රිය වන්නා වූ අවස්ථාවලදී මිළ ප්‍රකාශන/ලංසු තැබීම් තොරතුරු හා ගණුදෙනු ෆැක්ස් මගින් එව්විය හැකිය. කෙසේ වුවත් පද්ධතිය පණ ගැන්වුණු විගස අදාළ තොරතුරු පද්ධතියට උඩුගත (upload) කළ යුතු ය.

3.1 මෙම රෙගුලාසි 2016 ජූනි 01 වැනි දින සිට බලපැවැත්වේ. — 3. වලංගු දිනය

06 - 467